බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

වර්ෂ අවසාන පරීක්ෂණය - 2020

ශ්‍රේණිය 10 විෂයය ඉස්ලාම් I කාලය පැය 01යි

## ලකුණු ක්‍රමය

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 3 | 21 | 2 | 31 | 4 |
| 2 | 3 | 12 | 4 | 22 | 4 | 32 | 1 |
| 3 | 2 | 13 | 1 | 23 | 1 | 33 | 3 |
| 4 | 2 | 14 | 4 | 24 | 2 | 34 | 4 |
| 5 | 3 | 15 | 1 | 25 | 4 | 35 | 4 |
| 6 | 1 | 16 | 3 | 26 | 1 | 36 | 4 |
| 7 | 4 | 17 | 2 | 27 | 3 | 37 | 2 |
| 8 | 4 | 18 | 4 | 28 | 2 | 38 | 3 |
| 9 | 3 | 19 | 3 | 29 | 1 | 39 | 1 |
| 10 | 2 | 20 | 4 | 30 | 3 | 40 | 2 |

(1*40=40)

### 2 කොටස

1.

I. කදරිය්යා, ජබරිය්ය, මුර්ජිආ, uq#;is,d

II. සුළු කිල්ල, මහා කිල්ල

III. පරිහරණය කරන ලද ජලය (කුල්ලතයින් ප්‍රමාණයට වඩා අඩු ඉතා පිරිසිදු ජලය ෆර්ලු වන නෑම, වුලූ කිරීම වැනි ෆර්ලු වන වගකීම් උදෙසා භාවිතා කලේ නම් මෙම ජලය මෙසේ හඳුන්වයි.)

IV. අල්කුර්ආනය හා අස්සුන්නාහ්ව (කිතාබ් ආගම් - හික්මා - ඥානය)

V. දාරුල් ෆනා - විනාශ වන මෙලොව ජීවිතය
දාරුල් බකා - නිමක් නොමැති පරලොව ජීවිතය

VI. ඉස්තිහ්සාන් , ඉස්තිස්ලාහ් , ඉස්තිස්හාබ් , උර්ෆ් , අෂ්ෂරාඉඋස් සාබිකා , කව්ලුස් සහාබි

VII. විශ්වාසය සම්බන්ධ හා ක්‍රියාකාරකම් සම්බන්ධ

VIII. බුද්ධිය සම්බන්ධ - කායික ශ්‍රමය

IX. නූහ් (අලෛ) තුමා

X. වහී මත්ලූව් - පාරායනා කර පෙන්වූ
වහී හයිරු මත්ලූව් - පාරායන කර නොපෙන්වූ

(2*10=20)

2.

I. ඉබාදත් , ඉමාරත් , කිලාෆත්

II.

- සිත පාලනය කර දේව බිය බැතිය ඇති කර ගැනීම.
- අල්ලාහ් සමගින් බැඳීම් වර්ධනය කර ගැනීම.
- පාපී ක්‍රියාවන්ගෙන් වැළකී ජීවත් වීමට පුරුදු වීම.
- පරිත්‍යාගශීලීත්වය , ඉවසීම , අන්‍යයන්ට යහපත සැලසීම වැනි ගුණාංග වර්ධනය කර ගැනීම.
- දේව තෘප්තිය ලබා ස්වර්ගයට ඇතුළු වීමට මග පාද ගැනීම.
  (මෙවැනි කරුණු තුනක් ලියා ඇත්නම් ලකුණු 3)

III.

- ෂරීආවේ අනුමැතිය
- පිවිතුරු චේතනාව
- ෂරීආවේ සීමාව ඉක්මවා නොයෑම
- මූලික වතාවත් වලට අවහිර නොවීම
- නිවැරදිව හා පිළිවෙලට ඉටු කිරීම
  (මෙම කරුණු පහ ලියා කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු 5)

(2+3+5= 10)

3.

I. තස්කියා යන අරාබි පදයේ තේරුම පාරිශුද්ධ කිරීම , පිළිවෙලට සකස් කිරීම වේ.
භාෂා ව්‍යවහාරයේ චිත්ත පාරිශුද්ධිය අර්ථය වන අතර තස්කියතුන් නෆ්ස් වේ.

II.

- අල්කුර්ආන් හා හදීස් අපට පෙන්වාදෙන මගපෙන්වීම් පිළිපැද ආටෝපය , ආඩම්බරකම , ඊර්ෂියාව වැනි පහත් ගුණාංග වලින් වැලකීම.
- ෆර්ලු වන වගකීම් නියමිත ආකාරයට ඉටු කිරීම
- සුන්නත් වන වතාවත් ඉටු කිරීම
- දික්ර් හි නියැළීම
- අල්කුර්ආනය පාරායනා කිරීම
- තව්බා කිරීම
  (මෙවැනි කරුණු තුනක් සඳහන් කර ඇත්නම් ලකුණු 3)

III. එක - නෆ්සුල් අම්මාරා බිස්සූඃ
අයහපතට පොළඹවන සිත. මෙය යහපත උදෙසා උත්සුක නොකරයි.

දෙක - නෆ්සුල් ලව්වාමා
තමාවම රිදවාගන්නා සිත. හැඟීම් උත්සන්නවී අකුසෙහි නියැලුනේ නම් ඒ වෙනුවෙන් සිතින් පසුතැවිලි වේ.

තුන - නෆ්සුල් මුත්මඉන්නා
තෘප්තිමත් සිත. කලබලයෙන් හා නොසන්සුන් බවින් තොර තැන්පත් තත්වයක් දක්නට ලැබේ. යහපත කෙරෙහි ඇති පොළඹවීම් අධික වශයෙන් දක්නට ලැබේ.
(තුනම ලියා විස්තර කර ඇත්නම් ලකුණු 5)

(2+3+5=10)

4.

I. මුහම්මද් නබි (සල්) තුමාගේ ජීවිත කථාව

II.

- හරාම් වූ දෑ අඩංගු භාණ්ඩයක් නොවිය යුතුයි.
  (උදා: මධ්‍යසාර)
- හරාම් වූ ක්‍රියා මගින් ලබා ගත් දෙයක් නොවිය යුතුයි.
  (උදා: පොළිය , අල්ලස)
- ජනතාවට හිරිහැරයක් හෝ රැවටීමක් වන දෙයක් නොවිය යුතුයි.
  (උදා: සඟවා තැබීම් )
- පොදු නීති උල්ලංඝනය කිරීමේ ක්‍රියාවක් නොවිය. යුතුයි
  (උදා: කළු කඩ , භාණ්ඩ පැන්නීම)
- යහපත් සාරධර්ම වලට පටහැනි නොවිය යුතුයි.
  (උදා: බොරු , වංචාව)
  (මෙවැනි කරුණු තුනක් ලියා ඇත්නම් ලකුණු 3)

III.

- දේව ගුණාංග
- කිසි කෙනෙකුට අසාධාරණයක් නොවීම
- නම්‍යශීලීභාවය
- සමාජය තුල පැන නගින ආර්ථික උස් පහත්කම් විධිමත් කිරීම
- සමාජ යහපත හා පෞද්ගලික යහපත අතර සම්බන්ධතාවක්ඇති කිරීම
- අධ්‍යාත්මික අවශ්‍යතා සහ ලෞකික අවශ්‍යතා ගැන සමව සැලකිල්ලට යොමු කිරීම.
  (මෙවැනි කරුණු පහක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 5)

(2+3+5=10)

5.

I. දුල්කර්නයින් රජු

II.

- ගැනුම්කරු , විකුණුම්කරු
- වෙළඳ භාණ්ඩ
- ඊජාබ් - කබූල්

III.

- ඔවුන්ගේ ගනුදෙනු ක්‍රියාවලිය නැමදුමක් බවට පත් වේ.
- මිලදී ගන්නා හා විකුණන්නා අතර සුහදතාවක් ඇතිවේ.
- වෙළඳාමේ ස්ථාවරත්වයක් ඇතිවේ.
- අනවශ්‍ය දෝෂාරෝපණ වලින් ආරක්ෂාව ලැබේ.
- හරාම් වන ගනු දෙනු වලින් මිදිය හැක.
  (මෙවැනි කරුණු පහක් ලියා ඇත්නම් ලකුණු 5)

(2+3+5=10)

6.

I. සුරා ලුක්මාන් , සුරා ෆුර්කාන්

II.

- අල්ලාහ් වෙතය යන පිරිසිදු චේතනාවෙන් තව්බා කිරීම.
- තමා කල පාප අතහැර එයින් සහමුලින්ම ඉවත් වීම.
- පෙර කල ඒ පාපය නැවතත් නොකරමි යනුවෙන් ප්‍රතිඥා දීම.
- කරන ලද පාපය මිනිසා හා සම්බන්ධ වන්නේ නම් ඔහුගෙන් සමාව ඉල්ලා පසුව අල්ලහ්ගෙන් සමාව අයැදීම.

III. වහී ගෛරු මත්ලුව් යනු පාරයනා කර නොපෙන්වූ වහී වේ. මෙය විවිධ ආකාරයෙන් දේව ධර්ම දූතයන්ට හිමි වේ. උදාහරණ ලෙස ඉබ්‍රාහිම් (අලෛ) තම පුත් ඉස්මායිල් (අලෛ) තුමාව කුර්බාන් කරන ලෙස සත්‍ය සිහිනයක් දුටුවේය. එවැනි සත්‍ය සිහින මෙහි අන්තර්ගතවේ. එසේ ම මූසා (අලෛ) තුමා තූර්සිනා කන්ද අසලින් යන විට හඬක් ඇසීම. Zසකරියියා (අලෛ) තුමා තම සමාජයට සංඥා මගින් අල්ලාහ් නැමදීමටද ප්‍රශංසා කිරීමටද ඉගැන්වූයේය. මුහම්මද් (සල්) තුමාණන්ගේ හදීස් නැතහොත් සුන්නා.

(2+3+5=10)

7.

I. උස්මාන් රලි තුමාගේ කාලයේ අල්කුර්ආනය ගොනු කිරීම

අල්කුර්ආනය ගොනු කිරීමේ ඊළග පියවර , කලීෆා උස්මාන් රලි තුමාගේ කාලයේ සිදුවිය. එතුමාගේ කාලයේ අර්මේනියාව , අසර් බයිජාන් යන ප්‍රදේශවල මුස්ලිම් ජාතිකයෝ සටන් වල නිරත වෙමින් සිටියහ. ඔවුහු අල්කුර්ආනය පාරයනා කරන විට විවිධාකාරයෙන් පාරයනා කළහ. එපමණක් නොව තම පාරායන රටාව නිවැරදි යැයි තර්ක කළහ. මෙය හුදෙයිෆා අල් යමානි (රලි) තුමා අවධාරණය කළහ. කලීෆා තුමා වහාම ක්‍රියාත්මක විය. සයිද් බින් තාබිත් (රලි) තුමාගේ නායකත්වය යටතේ කුරෙෂ්වරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කළේය. කලීෆා තුමා ඔවුන්ගෙන් කුරෙෂ්වරුන්ගේ උච්චාරණය අවධානයට ලක් කරමින් පිටපත් අටක් සකස් කළහ. ඒවා එක් එක් පළාත් වලට යවනු ලැබුණි. එම පිටපත් සමග කුරෙෂ්වරුන්ගේ ව්‍යවහාරයට පාරයනා කල හැකි කාරිවරුන්ද යැව්වේය. එම කාරිවරුන් සේ පාරායානා කිරීමට උපදෙස් දෙනු ලැබුණි. අනෙක් පිටපත් සියල්ල ගිනිබත් කල යුතුය යන්නත් අණ කළේය.මේ නිසා සියලු දෙනාව අල්කුර්ආනය එකම ආකාරයට පාරයනා කරන තත්වයක් ඇතිවිය. මේ නිසා උස්මාන් රලි තුමා ‘‘ජාමිඋල් කුර්ආන්’’ යනුවෙන් හඳුන්වනු ලැබීය.

II. අජ්නබි මහ්රම්

පවුලේ නෑකම හේතුවෙන් නැත්නම් විවාහක නෑකම නැතහොත් කිරි නෑකම හේතුවෙන් එක් ස්ත්‍රීයකුට හෝ පුරුෂයකුට ස්ථිරව විවාහ වීමට තහනම් වූ පුරුෂය හෝ ස්ත්‍රීය මහ්රම් ලෙස හැදින්වේ. විවාහ වීමට අනුමැතිය ලත් අය අජ්නබ් වේ.

අජ්නබ් වූ අය සමග ආශ්‍රය කිරීමේදී අනුගමනය කල යුතු කරුණු බැල්ම පාලනය කර ගැනීම , කාන්තාව අව්රතය සම්පූර්ණයෙන් වැසීම , ඇවිදීම ඇඳුම් ඇදීම , හැසිරීම හා කතා කිරීම පිළිපැදීම , පිරිමින්ගේ හැඟීම් ඇවිස්සෙන ක්‍රියාවල නොදීම, ස්ත්‍රී පුරුෂ හුදකලා වීමට ඇති අවස්ථා සීමා කිරීම.

III. සලාතයේ මෙලොව හා පරලොව ප්‍රයෝජන

අල්ලාහ් සමග සංවාදයේ යෙදීම,අල්ලාහ් සිහිපත් කිරීම හා සැනසුම , දේව දයාව , ස්වර්ගයේ යතුර, පරාර්ථකාමී හැඟීම හා නොසැලෙන සිත, පාපීක්රියාවන්ගෙන් ආරක්ෂාව , පව් කමාව ලැබීම,පරමාන්ත දිනයේ සාක්ෂියක් වීම , බාහිර අභ්‍යන්තර පිරිසිදුකම, නිරයේ වේදනාවෙන් ආරක්ෂාව.

IV. ශාරීරික අභ්‍යාස

ශරීරය නියමිත මට්ටම තුල තබා ගැනීම ඉබාදත් වේ. යහපත් ශරීර සෞඛ්‍යයට ශාරීරික අභ්‍යාස අතිශයින් වැදගත්වේ. ශාරීරික අභ්‍යාසවල නිරත වීම ඉස්ලාම් දැඩි ලෙස උනන්දු කර ඇත. දරුවන්ට පිහිනීමටත්, දුනු විදීමටත් , අශ්වයා පිට සවාරි යාමටත්, උගන්වන්න යැයි නබි සල් තුමා අවධාරණය කළේය.

(5+5=10)

මුළු ලකුණු
I කොටස = 40
II කොටස = 60
මුළු ලකුණු = 100